# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2049/9 – 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා – 2017.12.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන
වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2017.11.21 වැනි දින සම්මත කරන ලදුව, 2017.11.27 වැනි දින වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

ආර්. එම්. ආර්. එම්. රත්නායක,
සභා ලේකම්,
වයඹ පළාත් සභාව.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ
සභා ලේකම් කාර්යාලයේදීය.


1A – PG 3811 – 08(2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාත් සභාව

## වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන
## වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය

වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක
සේවා වනිතා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන වයඹ පළාත්
ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය

වයඹ පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම. එවැනි බෙහෙත් ශාලාවලට සහ රෝහල්වලට ආධාර මුදල් ලබාදීම, ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම, එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම පිණිස හා ඊට ආනුෂංගික කරුණු පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි. දීර්ඝ නාමය

මෙහි විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට 1961 අංක 31 දරන ආයුර්වේද පනත අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ. ප්‍රඥප්තියේ අරමුණු.

(1) වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම හා පවත්වාගෙන යාමට අදාළ විධිවිධාන සැලැස්වීම.

(2) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාතේ දේශීය වෛද්‍ය කටයුතුවලට අදළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම හා අධීක්ෂණය.

(3) දේශීය වෛද්‍ය කටයුතු සඳහා වන උපදේශක මණ්ඩලයක් පිහිටුවීම හා පළාත්බද වෛද්‍ය පර්යේෂණ පහසුකම් සැපයීම.

(4) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු හා ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(5) ආයුර්වේද, සිද්ධ, යුනානි හා පාරම්පරික යන දේශීය වෛද්‍ය ක්‍රම වයඹ පළාත තුළ පවත්වාගෙන යාම, සංරක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(6) ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, පවත්වාගෙන යාම හා පහසුකම් සැලසීම.

(7) ඖෂධ උද්‍යාන පිහිටුවීම, දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ඒ සඳහා නිෂ්පාදනාගාර හා ගබඩා පවත්වාගෙන යාම.

(8) දේශීය වෛද්‍ය කටයුතු ප්‍රවර්ධනය හා නියාමනය කිරීම උදෙසා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයින් සම්බන්ධීකරණය කර ක්‍රියාකාරී දයකත්වය ලබා ගැනීම.

1 වන කොටස

**පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම, බලතල, සංයුතිය හා කාර්යභාරය**

03. මෙම ප්‍රඥප්තියේ අරමුණ ඉටුකිරීම සඳහා මෙහි මින්මතු ''දෙපාර්තමේන්තුව'' යනුවෙන් හඳුන්වනු ලබන ''වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව'' පිහිටුවිය යුතු වන්නේය. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම.

04. (1) මෙම ප්‍රඥප්තියේ බලතල විධිවිධාන හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ''පළාත් ආයුර්වේද කොමසාරිස්'' යනුවෙන් හඳුන්වනු ලබන ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු පත්කළ යුතු වන්නේ ය. එම පත්කිරීම විෂයභාර අමාත්‍යවරයා කොමසාරිස්වරයා පත් කිරීම හා දෙපාර්තමේන්තුවේ සංයුතිය.

විමසා පළාත් ආණ්ඩුකාරවරයා විසින් සිදු කළ යුතු වන්නේ ය.

(2) කොමසාරිස්වරයාට සහාය පිණිස පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක දෙක සඳහා අවශ්‍ය වන්නා වූ නියෝජ්‍ය කොමසාරිවරුන්, සහකාර කොමසාරිස්වරුන්, රෝහල් අධ්‍යක්ෂවරුන්, කාර්යභාර වෛද්‍ය නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරීන්, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්, ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ සෙසු කාර්ය මණ්ඩලයෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තියේ කොමසාරිස් වෙත පැවරෙන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොසාරිස්වරුන්, රෝහල් අධ්‍යක්ෂවරුන්, කාර්යභාර වෛද්‍ය නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරීන්, ආයුර්වේද වෛද්‍ය නිළධාරීන්, ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ සෙසු නිළධාරීන් වෙත කොමසාරිස්වරයා විසින් ස්වකීය බලතල පැවරිය හැක්කේය.

(4) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත තනතුරු දරන්නාවූ සියලුම නිළධාරීන් සහ සෙසු කාර්යය මණ්ඩලයේ සේවකයින් ඔවුන් දනට පවතින සේවා තත්වය මත මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබුවා සේ සැලකිය යුතු වන්නේය.

(5) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත්කරනු ලබන සියලුම නිළධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිළධාරීන් වශයෙන් සැලකිය යුතු වන්නේය.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

(5) මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

(1) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික සංවර්ධන සැලැසුම් සකස් කිරීමෙන් අනතුරුව හා අනුමත කරන ලද එකී සංවර්ධන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම උපරිම ඵලදයීත්වයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම.

(2) පළාත් ආයුර්වේද රෝහල්, දිස්ත්‍රික් ආයුර්වේද රෝහල්, ආයුර්වේද මූලික රෝහල්, ග්‍රාමීය ආයුර්වේද රෝහල්, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද සායන මධ්‍යස්ථාන, ආයුර්වේද ප්‍රවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම, පරිපාලන හා පවත්වාගෙන යාම සහ ප්‍රතිකාර සේවා සැපයීම.

(3) මහජන සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන ආයතන පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(4) රෝග නිවාරණය සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය, ප්‍රජා සෞඛ්‍ය සේවා කටයුතු ක්‍රියාත්මක කිරීම.

(5) රෝගීන් සඳහා ගුණාත්මක, කාර්යක්ෂම හා ඵලදයී සේවාවක් ඉටු කිරීමට වගබලා ගැනීම.

(6) පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ප්‍රචලිත කිරීම, විශේෂ අවස්ථාවලදී විශේෂ හැකියාවන් තිබෙන පාරම්පරික දේශීය වෛද්‍යවරුන්ගේ සහාය ලබා ගැනීම.

(7) දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා ඔසු වගාවන්, ඔසු උයන්, තවාන් පවත්වාගෙන යාම, නඩත්තුව, අවශ්‍ය පහසුකම් හා උපදෙස් සැපයීම, දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම, නියාමනය හා අධීක්ෂණය.

(8) පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් නොවන දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් රෝහල්, බෙහෙත් ශාලා, ඖෂධ නිෂ්පාදනාගාර හෝ දේශීය වෛද්‍ය ක්‍රමයට ගැනෙන්නා වූ රසායනාගාර, සේවා මධ්‍යස්ථාන හෝ ඊට ආනුෂංගික ආයතන, ඖෂධ ගබඩා හා ඖෂධ අලෙවිසැල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවල ආදළ ආයතනයන්ට ප්‍රවේශ වීම හා පරීක්ෂා කිරීම.

(9) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු සහ ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවා පවත්වාගෙන යාම.

(10) දේශීය වෛද්‍ය සේවා සැපයීම සඳහා ගාස්තු අයකරනු ලබන වාට්ටු පවත්වාගෙන යාම.

(11) දේශීය හා විදේශීය සංචාරකයින්ට දේශීය වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

(12) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(13) ලියාපදිංචි දේශීය වෛද්‍යවරුන්ට අවශ්‍ය රස ඖෂධ හා අන්තරායකාරී ඖෂධ සැපයීම සඳහා ගබඩා පවත්වාගෙන යාම, නිකුත් කිරීම හා නිර්දේශ ලබාදීම.

(14) ආයුර්වේද ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් රෝගී සත්කාරක සේවාවන් ගුණාත්මකව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පර්යේෂණ කටයුතු ඉටු කිරීමට අවශ්‍ය ආයුර්වේද පළාත්බද පර්යේෂණ මණ්ඩලයක් ස්ථාපිත කිරීම.

(15) විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන වෛද්‍ය සිසුන් පුහුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(16) දෙපාර්තමේන්තුමය කාර්යය මණ්ඩලය සඳහා ජාතික වෘත්තීය නිපුණතා (NVQ) මට්ටමේ පාඨමාලා පැවැත්වීම හා සහතික නිකුත් කිරීම

(17) ආයුර්වේද ක්ෂේත්‍රයට අදළ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

(18) ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය කෙරෙන (පරිකල්පිත) අවකාශය (සයිබර් අවකාශය) භාවිතා කරමින් සිදු කරන දේශීය වෛද්‍ය කටයුතු හා සේවා සැපයීම්, අධීක්ෂණය හා නියාමනය කිරීම.

(19) ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය සහ නිෂ්පාදිත ඖෂධවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ප්‍රමිති අංශයක් පිහිටුවීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

(6) (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු, වාර්තා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිළධරයකු විසින් යම් ආයතනයකින් හෝ පුද්ගලයකු වෙතින් ඉල්ලා සිටිය හොත්, ඔහු විසින් හෝ එම ආයතනය විසින් එම තොරතුරු ලබාදිය යුතු වන්නේය. දෙපාර්තමේන්තුවේ බලතල

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන යම් නිලධරයකුට කලින් දැනුම්දීමකින් හෝ දැනුම්දීමකින් තොරව ඕනෑම වේලාවක වයඹ පළාත තුළ ඇති මධ්‍යස්ථාන වෙත, දේශීය වෛද්‍ය සේවා සපයන ඕනෑම ආයතනයක් වෙත ඇතුළත් වීමට හා,

(අ) යම් පරීක්ෂා කිරීමක්, විභාග කිරීමක්, විමර්ශනය කිරීමක්, පරීක්ෂණයක් පැවැත්වීමට.
(ආ) අවශ්‍ය විය හැකි ලිපිලේඛන පරීක්ෂා කිරීමට හෝ තොරතුරු ලබා ගැනීමට,
(ඇ) අවශ්‍ය ලිපිලේඛන භාරයට ගැනීම ඇතුළු ඊට ආදල ඕනෑම ක්‍රියාවක් කිරීමට බලය ඇත්තේය.

(3) 6 (2) උප වගන්තියේ දක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් පාලන ආයතනයකින් පාලනය වන දේශීය වෛද්‍ය සේවා සපයන ආයතනයකට ඇතුල්වීමේදී එහි ප්‍රධාන විධායක නිළධාරියා දැනුවත් කළ යුතු වන්නේය.

(4) අධිකරණයේ අවසරය අවශ්‍ය යම් තොරතුරු සහිත ලේඛන හා රෝගීන්ගේ වෛද්‍ය වාර්තා පරීක්ෂා කිරීමට ඉහතින් වූ නිළධාරීන්ට විශේෂයෙන් පවරන ලද බලයක් ඇත්නම් මිස, අවසර නැත්තේය.

## II වන කොටස

### ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කිරීම

ප්‍රතිපත්ති සම්පාදනය

07. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතුවලට අදළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේය. ඒ සඳහා පළාත තුළ ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවලට අනුයුක්තව ස්ථාපිත කර ඇති රෝහල් සංවර්ධන කමිටුවල, රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයන්ගෙන් යෝජනා ලබාගත හැකි වන්නේය.

සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

08. පළාත තුළ ජනගහනය, යටිතල පහසුකම්, සමාජීය හා අදළ වන අනෙකුත් සාධක හා නිර්ණායකයන් පදනම් කරගෙන වාර්ෂික පළාත් ආයුර්වේද සැලැස්ම ආයුර්වේද කොමසාරිස් විසින් සකස් කර, ලේකම්වරයාගේ අනුමැතියට වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වන්නේය.

සේවාවන් සැපයීම

09. පළාතේ ජනතාවගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව සඳහා දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගී කර ගැනීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒ සඳහා ජනතා නැඹුරුව වැඩි කරලීම, පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම හා සංරක්ෂණය කිරීම, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා පිහිටුවීම හා පවත්වාගෙන යාම, ඔසු උයන් පිහිටුවීම හා පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය ක්‍රම සඳහා අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය හා එහි කටයුතු සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ දයකත්වය ඍජුව හෝ වක්‍රව ලබා ගැනීම ඇතුළුව දේශීය වෛද්‍ය කටයුතු හා සම්බන්ධ සේවාවන් මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට හා විධිවිධානයන්ට අනුකූලව, පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේය.

අමාත්‍යවරයාගේ බලතල.

10 මෙම ප්‍රඥප්තියෙහි අරමුණු හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් නිකුත් කිරීම, මඟ පෙන්වීම හා නියෝග පැනවීම මෙහි මින්මතු 'අමාත්‍යවරයා' යැයි හඳුන්වනු ලබන වයඹ පළාත් දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා විසින් සිදු කළයුතු වන්නේ ය.

ලේකම්වරයාගේ බලතල.

11 මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන නියෝග, උපදෙස් හා මඟ පෙන්වීම් යටතේ පළාත් ආයුර්වේද දේශිය වෛද්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, පළාත් දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම හා පාලනය පළාත් දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

අභියාචනා කිරීම.

12 මෙම ප්‍රඥප්තියේ හි විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධරයකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැක්කේ ය. අමාත්‍යවරයාගේ නියමය පරිදි ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන නිලධරයකු විසින් හො පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයෙන් අනතුරුව, එම නියමය හෝ තීරණය ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අමාත්‍යවරයා විසින් කල හැකි වන්නේ ය.

දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම.

13 පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක දෙක සඳහා නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස් කාර්යාල පිහිටුවිය හැක්කේ ය.

## III වන කොටස

### වයඹ පළාත් ආයුර්වේද හා දේශිය වෛද්‍ය උපදේශක මණ්ඩලය

පළාත් දේශිය වෛද්‍ය උපදේශක මණ්ඩලය.

14 (1) දේශිය වෛද්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම ඇතුළු දේශිය වෛද්‍ය කාර්යභාරය ක්‍රියාවට නැංවීම පහසු කිරීම හා සහාය වීම පිණිස සාමාජිකයින් 15ක ගෙන් සමන්විත වන මෙහි මින්මතු ''උපදේශක මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන පළාත් දේශිය වෛද්‍ය උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කළ යුතු වන්නේ ය.

පළාත් දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා මෙම උපදේශක මණ්ඩලය පත් කරනු ලබන අතර , පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා උපදේශක මණ්ඩලයේ සභාපත්වරයා වන්නේ ය. පළාත් ආයුර්වේද කොමසාරිස් ලේකම්වරයා වන්නේ ය.

(2) උපදේශක මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් පහත සඳහන් වේ.

(අ) වයඹ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙකු.
(ආ) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු.
(ඇ) වයඹ පළාත් නීති අංශයේ නියෝජිතයෙකු.
(ඈ) වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු.
(ඉ) පළාත් ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂ.
(ඊ) පළාත් රාජ්‍ය සේවයේ නියුතු ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙකු.
(උ) දිස්ත්‍රික් ආයුර්වේද සංරක්ෂණ සහා සභාපතිපතිවරු දෙදෙනා.
(ඌ) පළාත තුළ පරිපාලන දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ප්‍රවීණ දේශීය වෛද්‍යවරු දෙදෙනෙක්.
(එ) දේශිය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් හා පළපුරුද්ද ඇති නියෝජිතයින් දෙදෙනෙක්.

(3) ඉහත (14)(2) උප වගන්තියේ සඳහන් (අ) සිට (උ) දක්වා වන අයට නිල බලයෙන් සාමාජිකත්වය හිමි වන්නේ ය. සාමාජිකයින් පත් කිරීම

(4) ඉහත (14)(2) උප වගන්තියේ සඳහන් (ඌ) සිට (එ) යටතේ සඳහන් අමාතයවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් මින් මතු පත් කළ සාමාජිකයින් වශයෙන් හඳුන්වනු ලබන්නේ ය.

(5) සභාවේ සෑම පත්කළ සාමාජිකයකු තමා විසින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස අවුරුදු තුනක (03) කාලයක් තම ධුරය දැරිය යුතු අතර, ඒ සඳහා නැවත පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) යම් තැනැත්තකු ;

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහෝසි වී ඇත්නම් හෝ අපරාධමය වරදක් සම්බන්ධයෙන් අධිකරණයේ වරදකරු වී ඇත්නම් හෝ බුන්වත් බව ප්‍රකාශයට පත් වී අත්නම් හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ, ආයුර්වේද දෙපාර්තුමේන්තුවේ, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කිසිදු ආකාරයක දඩුවමක හෝ විනය නියෝගයකට භාජනය වී අත්නම්, ඒ තැනැත්තා මණ්ඩලයේ පත් කළ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම සිටීමට නුසුදුස්සකු වන්නේ ය. සාමාජික වීමට නුසුදුසුකම්

(7) රෝගීව සිටීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයේ කාර්යභාරය ඉටු කිරීමට යම් පත්කළ සාමාජිකයකු අපොහොසත් වන බව මණ්ඩලයේ බහුතර සමාජිකත්වයේ තීරණය වන අවස්ථාවල දී ඔහු එම ධුරයෙන් ඉවත් කර ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය. ඉවත්වන සාමාජිකයින් වෙනුවෙන් සාමාජිකයින් පත් කිරීම.

(8) සෑම පත්කළ සාමාජිකයකු තම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී හෝ ඔහුගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(9) මණ්ඩලයේ රැස්වීම්වලට සහ එම රැස්වීම්වල දී කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පටිපාටි මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් සාදනු ලැබිය යුත්තේ ය. කාර්ය පටිපාටි සෑදීම

(10) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලය පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවන් හෝ කටයුතු හෝ අවලංගු නොවන්නේ ය. මණ්ඩලයේ කටයුතු අවලංගු නොවන බව

දීමනා ගෙවීම

(11) සභා රැස්වීම් වාරයන්ට සහභාගී වන සාමාජිකයින්ට ඒ වෙනුවෙන් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලබන යම් දීමනාවක් ගෙවිය හැකි වන්නේ ය.

සභා රැස්වීම

(12) මණ්ඩලය අවම වශයෙන් ලිත් මාස 02 කට වරක්වත් රැස්විය යුතු වන්නේ ය.

ගණ පූර්ණය

(13) සභා රැස්වීමක දී ගණපූර්ණ සාමාජිකත්වයෙන් $^1/_2$ (දෙකෙන් එක) කට නොඅඩු විය යුත්තේ ය.

මණ්ඩලයේ කාර්යභාරය

15 දේශිය වෛද්‍ය උපදේශක මණ්ඩලයේ කාර්යභාරය

(1) වයඹ පළාතේ දේශිය වෛද්‍ය කටයුතු නංවාලීමට, විධිමත් කිරීමට අදළ සියලු කරුණු සම්බන්ධයෙන් වන කාර්යයන් හා කර්තව්‍යයන් නිශ්චය කිරීමට අමාත්‍යවරයාට ඒ පිළිබඳව යෝජනා කිරීම හා නිර්දේශ කිරීම.

(2) දේශිය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමේ අදහසින් ආයුර්වේදයෙහි සියලුම අංශවල කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් ද, විශේෂයෙන්ම ආයුර්වේද සාහිත්‍ය, ආයුර්වේද ශාස්ත්‍රයෙහි මූලධර්ම, ආයුර්වේද චිකිත්සා, ආයුර්වේද ඖෂධ සංග්‍රහය යන කරුණු පිළිබඳව අවශ්‍ය කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් වන කාර්යය හා කර්තව්‍ය සම්පාදනය කිරීම, යෝජනා හා නිර්දේශ ලබාදීම.

(3) අමාත්‍යවරයා විමසනු ලබන පහත සඳහන් කරුණු ඇතුළු දේශිය වෛද්‍ය ක්ෂේත්‍රයට අදළ කරුණු සම්බන්ධයෙන් යෝජනා , නිරීක්ෂණ, උපදෙස් හා නිර්දේශ ලබා දීම.

(අ) දේශිය වෛද්‍ය පුස්තකාල, කෞතුකාගාර ඖෂධ නිධි, රසායනාගාර හා වෙනත් දේශිය වෛද්‍ය ආයතන පවත්වාගෙන යාම.

(ආ) ආයුර්වේද අත් පිටපත්, ආයුර්වේද ග්‍රන්ථ හා වෙනත් ආයුර්වේද සඟරා හෝ පොත් ප්‍රකාශ කිරීම.

(ඇ) ආයුර්වේද ඖෂධ ප්‍රචලිත කිරීම.

## IV වන කොටස

## ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු

රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම සහ සංයුතිය

16 වයඹ පළාත තුළ ඇති ආයුර්වේද රෝහල්වල සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු සහ ඒ හා සම්බන්ධ ආනුෂංගික කටයුතු මහජන සහභාගිත්වයෙන් යුතුව සිදු කිරීම සඳහා එම ආයතනයකට එකක් බැගින් රෝහල් සංවර්ධන කමිටු පිහිටුවා ගනු ලැබිය යුත්තේය.

කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

(අ) අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා.
(ආ) ආයතන භාර ආයුර්වේද වෛද්‍ය නිලධාරි සහ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.
(ඇ) ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති හෝ ඔහුගේ නියෝජිතයකු
(ඈ) රෝහල පිහිටි වසම භාර ග්‍රාම නිලධාරිවරයා.
(ඉ) ආසන්නතම පාසලේ විදුහල්පති හෝ නියෝජිතයකු
(ඊ) පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු
(උ) දේශීය වෛද්‍යවරු දෙදෙනෙකු
(ඌ) රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සහ හෝ ප්‍රදේශයේ ප්‍රභූවරුන් නියෝජනය කරමින් තිදෙනෙකු

ගණ පූර්ණය

17 කමිටු රැස්වීමක් පවත්වාගෙන යාම සඳහා සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත ගණපූර්ණයක් අවශ්‍ය විය යුතු වන්නේය.

18 (1) ප්‍රාදේශීය ලේකම්වරයා කමිටුවේ සභාපති විය යුතු අතර, ආයතන භාර වෛද්‍ය නිලධාරීවරයා ලේකම් විය යුතුය.

කමිටුවේ සභාපති හා ලේකම් සාමාජිකයින් පත් කිරීම

(2) ඉහත (16) වගන්තියේ (අ) සිට (ඊ) දක්වා සඳහන් වන අයට නිල බලයෙන් සාමාජිකත්වය හිමි වන්නේය.

(3) ඉහත (16) වගන්තියේ (උ) හා (ඌ) යටතේ සඳහන් සාමාජිකයින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, මෙම පත් කරනු ලැබූ සාමාජිකයන් මින් මතු "පත් කළ සාමාජිකයින්" වශයෙන් හඳුන්වනු ලැබිය යුත්තේය.

(4) කමිටුවේ නිත්‍ය සාමාජිකයින් අතරින් එක් අයෙකු භාණ්ඩාගාරිකවරයෙකු වශයෙන් පත්කර ගනු ලබන්නේ ය.

19 කමිටුවේ රැස්වීම්වලට සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පටිපාටි හා රීති මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, කමිටුව විසින් සාදනු ලැබ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබිය යුත්තේය.

කාර්ය පටිපාටි සෑදීම

20 ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටුවේ කාර්යභාරය පහත සඳහන් වේ.

කමිටුවේ කාර්යභාරය

(1) රෝහලේ හෝ මධ්‍යම බෙහෙත් ශාලාවේ සේවා ප්‍රදේශය තුළ දේශීය වෛද්‍ය හා ආයුර්වේද වැඩසටහන් සැලසුම් කිරීම, යෝජනා කිරීම.

(2) රෝහල සහ මහජනතාව, රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලයන් අතර සම්බන්ධීකරණය.

(3) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටුවට රජයේ බැංකුවක ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා හැක්කේය. මෙම ගිණුම දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට යටත් විය යුතු වන්නේය.

(4) දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගී කරගෙන ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා ගුණාත්මක සේවයක් සලසා දීමට සහාය වීම.

(5) රෝහල් හෝ මධ්‍යම බෙහෙත් ශාලාවල කටයුතු ප්‍රවර්ධනය කිරීම හා ප්‍රජා සෞඛ්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය යෝජනා/ නිර්දේශ අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම හා අනුමත යෝජනා ක්‍රියාවට නැංවීමට සහායවීම හා ක්‍රියාත්මක කිරීම.

## V වන කොටස

## පොදු විධිවිධාන

21. මෙම ප්‍රඥප්තියේ 29 වන වගන්තිය යටතේ යම් වරදක් රජයේ හෝ රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නොවන තැනැත්තෙකු සිදුකරනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ බලය කොමසාරිස් වරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිළධාරයකු හෝ සතු වන අතර, මෙම වැරදිවලට රජයේ නිළධරයෙකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිළධරයෙකු සම්බන්ධ වුවහොත් ඔහු සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කළ යුත්තේය.

නඩු පැවරීමේ බලය

22. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන්නා වූ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය යුත්තේ ය.

නියෝග පැනවීමේ බලය

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකොට දින 30 ක කාලයක් ඉකුත් වූ වහාම පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය.

(3) පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ යම් නියෝගයක් එකී නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකල යුත්තේ ය.

ප්‍රතිපාදන සැලසීම

23. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පිහිටුවන ලද ආයතන හා සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පළාතේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හා පළාත් සභා අරමුලින් සහ රජය විසින් අනුමත කරනු ලබන වෙනත් ප්‍රභවයකින් ලබාදිය යුත්තේ ය.

දේශීය වෛද්‍ය ආයතන ඇති කිරීම හා කොට්ඨාස ප්‍රතිසංවිධානය කිරීම

24. පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, රෝග ව්‍යාප්තිය, පෝෂණ තත්වය, පාරිසරික බලපෑම් සහ ගමනාගමන පහසුකම් ආදිය පදනම් කරගෙන ස්ථිර හෝ තාවකාලික පදනම මත නව දේශීය වෛද්‍ය ආයතන ඇති කිරීම, දේශීය වෛද්‍ය පරිපාලන කොට්ඨාස ඇති කිරීම, ප්‍රතිසංවිධානය කිරීම කළ හැකිය. එම ප්‍රතිසංවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කල යුත්තේ ය.

වයඹ පළාත් සභාවේ දේශීය වෛද්‍ය ආයතන දෙපාර්තමේන්තුව වෙත පැවරීම

25. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව දැනට වයඹ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ පවතින සියළුම දේශීය වෛද්‍ය ආයතන හා ඊට අදළ සියලුම චංචල හා නිශ්චල දේපළ දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබුවා සේ සැලකිය යුත්තේ ය.

පළාත් පාලන බලප්‍රදේශ තුළ සෞඛ්‍ය කටයුතු

26. පළාත තුළ ඇති පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සෞඛ්‍ය තත්වය පිළිබඳව අවශ්‍ය දේශීය වෛද්‍ය කටයුතු කිරීමට කොමසාරිස්වරයා හට බලය ඇති අතර, එම ප්‍රදේශ තුළ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ විස්තර වාර්තාවක් අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කරන ලෙස අදල පළාත් පාලන බලධාරින්ගෙන් ඉල්ලා සිටිය හැක්කේ ය.

තොරතුරු ලබාදිය යුතු බව

27. කොමසාරිස්වරයා විසින් මෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු කාරණාවලට අදළ වාර්තා හෝ තොරතුරු ලිඛිත දැනුම්දීමකින් නිශ්චිතව දක්වනු ලබන සාධාරණ කාලසීමාවක් තුළදී තත් කාර්ය සඳහා නිසි පරිදි බලය පවරන ලද නිළධරයා වෙත සපයන ලෙස යම් තැනැත්තෙකුට ලිඛිතව ඉල්ලීම් කරනු ලැබිය හැක්කේ ය.

අන්තර් කාලීන විධිවිධාන

28. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුවම වූ දිනයෙහි දේශීය වෛද්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා යම් ආකෘතියක්, දැන්වීමක්, බලපත්‍රයක්, ලේඛනයක් හෝ එවැනි ලියවිල්ලක් භාවිත කළ යුතු යැයි නියම කර තිබුනේ නම්, එම ආකෘතිය, දැන්වීම, බලපත්‍රය, ලේඛනය හෝ ලියවිල්ල මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරන ලද එකක් සේ සැලකිය යුත්තේ ය.

## VI වන කොටස

## වැරදි හා දණ්ඩන

වැරදි

29. (1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන හෝ යම් වාර්තාවක හෝ වෙනත් ලේඛණයක් මත දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයන් කරන්නා වූ,

(2) මෙම ප්‍රඥප්තිය යටතට ගැනෙන්නා වූ යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් නියම කර ඇති යම් තොරතුරු හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ,

(3) කොමසාරිස්වරයාගේ නියෝග හෝ නිවේදන සාධාරණ හේතුවකින් තොරව පැහැර හරින්නා වූ,.

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ පනවන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තෙකු වෙත පැවරි ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නා වූ

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පනවන ලද යම් නියෝගයක් හා විධිවිධානයක් හෝ කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම වුවමනාවෙන්ම පැහැර හරින සහ/ හෝ වුවමනාවෙන්ම අවහිර කරන්නා වූ, යම් තැනැත්තෙක් හෝ ආයතනයක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

(30). මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදුකරනු ලබන සෑම තැනැත්තෙකු ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු වුවහොත්, අවමය රුපියල් විසිදහසකට (රුපියල් 20, 000.00) නොඅඩු දඩයකට හෝ මාස තුනක් (3) නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේය. දඬුවම්

## VII වන කොටස

### අර්ථ නිරූපණය

මෙම ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අවශ්‍ය වන්නේ මිස,

(31) "පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද, අර්ථ නිරූපනය

"පළාත" යන්නෙන් කුරුණෑගල සහ පුත්තලම යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වයඹ පළාත ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාත් ආණ්ඩුකාරවරයාද,

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය ද,

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා ද,

"ලේකම්" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

"කොමසාරිස්" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ද,

"පළාත් පාලන ආයතන" යන්නෙන් වයඹ පළාතේ මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාද,

"දේශීය වෛද්‍ය" යන්නෙන් ආයුර්වේද, සිද්ධ, යුනානි සහ පාරම්පරික වෛද්‍ය ක්‍රම ද,

"ඖෂධ" යන්නෙන් දේශීය ආයුර්වේද, සිද්ධ, යුනානි සහ පාරම්පරික ඖෂධ ද,

"ආනුෂංගික අනෙකුත් සේවාවන්" යන්නෙන් ජ්‍යොතිෂ ශාස්ත්‍රය ද, භූත වෛද්‍ය ක්‍රම ද, සත්ත්ව සහ වෘක්ෂ වෛද්‍ය ක්‍රම ද, කටු චිකිත්සා සහ අනෙකුත් දේශීය, විදේශීය වෛකල්පිත වෛද්‍ය ක්‍රම ද,

"දේශීය වෛද්‍ය ආයතන" යන්නෙන් දේශීය වෛද්‍ය සේවා සපයනු ලබන සියලුම ආයතන ද,

මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා "දේශීය වෛද්‍ය ආයතන" යන්නෙන් රෝහල්, ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ බෙහෙත් ශාලා, ආයුර්වේද නිකේතන, සම්බාහන මධ්‍යස්ථාන, ඔසු සල්, ඔසු උයන් හා ඔසු තවාන්, අලෙවි සැල්, නිෂ්පාදනාගාර, ඖෂධ තොග ගබඩා, විලවුන් හා ඖෂධ නිෂ්පාදනාගාර, උපදේශන සේවා මධ්‍යස්ථාන, ආයුර්වේද රූපලාවන්‍යාගාර සහ ආයුර්වේද නමින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ආයතනයක් ආදියද,

"දේශීය වෛද්‍ය හා පාරම්පරික වෛද්‍යවරුන්" යන්නෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සහ නැති වයඹ පළාතේ සේවා සපයන සියලුම පාරම්පරික, ආයුර්වේද, සිද්ධ, යුනානි, හෝමියෝපති වෛද්‍යවරුන් ද, අදහස් කෙරේ.

32 මේ පනතේ සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

12-852

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.